# ලංසු ආරාධනය
# ප්‍රසම්පාදන දැන්වීම

## කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

### සී/ස ලංකා පොහොර සමාගම

**2024/25 වර්ෂය සඳහා සී/ස ලංකා පොහොර සමාගමේ පොළොන්නරුව ප්‍රාදේශීය පොහොර ගබඩාවේ පොහොර බෑම, පැටවීම, මිශ්‍ර කිරීම හා වෙනත් කම්කරු සේවාවන් සඳහා කම්කරුවන් යොදවා ගැනීමේ ලංසුව. ලංසු අංකය: 2024/25/CFC/POL/LB/01**

**2024/25 වර්ෂය සඳහා සී/ස ලංකා පොහොර සමාගමේ පොළොන්නරුව ප්‍රාදේශීය පොහොර ගබඩාවේ කම්කරු සේවාවන් 2024.05.22 වෙනි දින සිට 2025.05.21 වෙනි දින දක්වා පවත්වාගෙන යාම සඳහා විවිධ සේවා සමූපාකාර සමිති, සමූපාකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති, පුද්ගලික ආයතන සහ පුද්ගලයන්ගෙන් මුද්‍රා තබන ලද ලංසුපත් 2024.05.14 වන දින ප.ව. 2.30 දක්වා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් භාරගනු ලැබේ.**

**02. මෙම ලංසුවට අදාල ආකෘති පත්‍ර හා කොන්දේසි ආපසු නොගෙවනු ලබන රු.3,000.00 (රුපියල් තුන්දහසක) මුදලක් වත්තල, හුණුපිටිය, ස්වර්ණ ජයන්ති මාවතේ පිහිටි සී/ස ලංකා පොහොර සමාගමේ ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමිට හෝ පොළොන්නරුව ප්‍රාදේශීය පොහොර ගබඩාවේ මුදල් භාරකරුට ගෙවීම් කර 2024.04.22 වන දින පෙ.ව.9.00 සිට 2024.05.13 වන දින ප.ව. 3.30 දක්වා ලබා ගත හැකිය.**

**03. සීල් තබන ලද ලංසු පත්‍රිකා ලංසු අංක: 2024/25/CFC/POL/LB/01 යනුවෙන් ලිපි කවරයේ සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට 2024.05.14 වන දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. එසේ නැතහොත් වත්තල, හුණුපිටිය, සී/ස ලංකා පොහොර සමාගමේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහා ලිය යුතුය. නියමිත දින නියමිත වේලාවට පසු ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කර ලංසුකරුවන් වෙත ආපසු බාරදෙනු ලැබේ.**

**04. ලංසුව 2024.05.14 වන දින ප.ව. 2.30 න් අවසන් වන අතර, ඒ සමගම විවෘත කරනු ලැබේ. ලංසුව විවෘත කරන අවස්ථාවේදී ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට පැමිණ සිටිය හැකිය.**

**05.ලංසු කොන්දේසියෙහි සඳහන් පරිදි, ආපසු ගෙවනු ලබන රු.75,000.00 (රුපියල් හැත්තෑපන්දහසක ) ලංසු සුරක්ෂණ ඇපකරයක් ලංසුව සමඟ ඉදිරිපත් කල යුතුය. ඒ සඳහා බැංකු ඇපකරයක් හෝ අදාල මුදල් සී/ස ලංකා පොහොර සමාගමට ගෙවා ලබා ගත් කුවිතාන්සිය ලංසුවට ඇමිණිය යුතුය.**

**06.පූර්ව ලංසු රැස්වීම 2024.05.06 දින ප.ව 2.30 සී/ස ලංකා පොහොර සමාගමේ ප්‍රසම්පාදන අංශයේදී පැවැත්වේ.ඒ සඳහා සහභාගී වීම සඳහා සියළුම ලංසුකරුවන්ට ආරාධනා කරනු ලැබේ.**

**07.මේ පිළිබඳව වැඩි විස්තර වත්තල හුණුපිටිය,ස්වර්ණ ජයන්ති මාවත පිහිටි සී/ස ලංකා පොහොර සමාගමේ වැ.බ කළමනාකරු (ප්‍රසම්පාදන හා ආනයන) දු.අ:-011-2947765/077-2069981,ෆැක්ස් : 011-2930423) ගෙන් හෝ පොළොන්නරුව ප්‍රාදේශීය පොහොර ගබඩා සංකීර්ණයේ වැ.බ ප්‍රාදේශීය අලෙවිකරුගෙන් (දු.අ :-027-2222177, 0773794697) ලබා ගත හැකිය.**

සභාපති,
ප්‍රසම්පාදන අංශය
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
සී/ ලංකා පොහොර සමාගම
ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවත,
හුණුපිටිය, වත්තල.
දිනය - 2024.04.22